00500

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව- **03** වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2023/2024**

**LLU3303** - රෝම නීතිය

කාලය පැය තුන **(03)** යි.

---

දිනය :**2025** මැයි **24** වේලාව: ප. ව. **1.30** - ප. ව. **4.30**

---

මුළු ප්‍රශ්න ගණන : **08**

**අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

**ප්‍රශ්ණ පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

1. "පසුකාලීන අධිරාජ්‍යය තුළ, නීති මූලාශ්‍ර සියල්ල අධිරාජ්‍ය බලයේ හුදු ප්‍රකාශනයන් පමණක් බවට පත් විය.... අධිරාජ්‍ය බලය මත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සීමාවක් ලෙස පැවති නීතිවේදීන්ගේ සහ සෙනෙට් සභිකයින්ගේ අධිකාරය නැවතී ගියේය."

   Domingo Osle, Rafael, *Sources of Roman Law,* SSRN 2018.

   රෝමය, ජනරජ අවධියේ සිට සැහවුණු අධිරාජ්‍ය අවධිය දක්වා සහ පසුකාලීන අධිරාජ්‍යයක් බවට පරිවර්තනය වීම සම්බන්ධයෙන් රෝම නීතියේ විෂය පථය පෝෂණය කිරීමෙහි ලා දායක වූ විවිධ මූලාශ්‍ර ඉහත ප්‍රකාශය අනුසාරයෙන් පැහැදිලි කරන්න.

   **(ලකුණු 20)**

2. සර්වියස් යනු, ක්වින්ටස් සහ ජූනියස් යන පුතුන් දෙදෙනෙකුගේ සහ ප්‍රීමා නම් දියණියකගේ පියා වේ. ඔහු, තම දියණිය වන ප්‍රීමා උරුමයෙන් බැහැර කර, ක්වින්ටස් සහ ජූනියස් තම දේපළෙහි උරුමකරුවන් ලෙස නම් කරමින් අන්තිම කැමති පත්‍රයක් සකස් කළේය. කෙසේ වෙතත්, සර්වියස් තම අන්තිම කැමති පත්‍රයේ උරුමකාරිත්වයෙන් ප්‍රීමා ප්‍රකාශිතව බැහැර නොකළේය. මාස හයකට පසු, හදිසි අසනීපයක් හේතුවෙන් ක්වින්ටස් මිය ගියේය. ජූනියස්, සර්වියස්ගේ පරම සතුරා ගේ දියණිය වන සබීනා සමඟ සමීප සම්බන්ධතාවයක් ආරම්භ කර තිබූ බැවින්, ජූනියස් සබීනා සමඟ විවාහ වුවහොත්, මුල්

අන්තිම කැමති පත්‍රය යටතේ ජූනියස්ට පවරා ඇති ඕනෑම දේපලක් ඔහුට අහිමි වන බවට නියම කරන කොඩිසිල් පත්‍රයක් සකස් කිරීමට සර්වියස් අදහස් කළේය.

ඉහත සිද්ධිමය අවස්ථාවන් විශ්ලේෂණය කර, අන්තිම කැමති පත්‍රයක් සහිත අනුප්‍රාප්තිය පිළිබඳ රෝම නීති මූලධර්ම සලකා බලමින් , ඒවායේ නීතිමය අනුෂාංග සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

3. රෝම නීතිය යටතේ පහත දැක්වෙන සංකල්ප විස්තර කරන්න.

(i) *dominia potestas*

(ii) *patria potestas* හි ආරම්භය සහ අවසානය

**(ලකුණු 10 x 2 =20)**

4. ප්‍රිසිලා ඇගේ පීතෘ මුලිකයාගේ විරෝධතාවය නොතකා යුධ සේවයේ නිරත සොල්දාදුවෙකු සමඟ විවාහ වූවාය. මාස කිහිපයකට පසු, ඇගේ ස්වාමි පුරුෂයා සතුරු හමුදාවන් විසින් අල්ලා ගන්නා ලදී. පසුව, ප්‍රිසිලාගේ පීතෘ මුලිකයා රෝමයේ පදිංචි ධනවත් වැන්දඹු පුරුෂයෙකු වන ලූෂියස් සමඟ ඇගේ විවාහය සූදානම් කළේය. කෙසේ වෙතත්, ප්‍රිසිලා පසුව සොයාගනු ලැබුවේ ලූෂියස් සැබවින්ම වැන්දඹු පුරුෂයෙකු නොවන බවත්, ඔහුගේ ආබාධිත බිරිඳ තවමත් ජීවත්ව සිටින අතර ඇයව ඔහුගේ මන්දිරය තුළ රහසිගත කුටියක සඟවා ඇති බවත් ය . මේ අතර, ප්‍රිසිලාගේ පළමු සැමියා වහල්භාවයෙන් නිදහස් වීමෙන් පසු නැවත නිවසට පැමිණි අතර, ප්‍රිසිලාට ඇගේ විවාහයේ වලංගුභාවය පිළිබඳව අවිනිශ්චිතතාවයක් මතුවී තිබේ.

වලංගු විවාහය පිළිබඳ රෝම නීති මූලධර්ම අදාළ කරගනිමින් ප්‍රිසිලාට උපදෙස් දෙන්න.

**(ලකුණු 20)**

5. (i) රෝම නීතිය යටතේ දේපල *(res)* වර්ගීකරණය පිළිබඳව පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

(ii) *ius civile* යටතේ දේපළ අත්පත් කර ගැනීමේ ක්‍රම විස්තර කරන්න.

**(ලකුණු 10)**

**(ලකුණු 10 x 2 =20)**

6. (i) රෝම නීතිය යටතේ පරවශතා වර්ගීකරණය විස්තර කරන්න. අවශ්‍ය තැන්හිදී උදාහරණ සපයන්න.

(ලකුණු 10)

(ii) පහත සඳහන් අවස්ථාවන්හි නීතිමය අනුෂාංග හඳුනා ගන්න:

(අ) රොමියුලස්ට තම අසල්වැසි ඒලියස්ගේ ඉඩම හරහා මාර්ගයට පිවිසීමට ගම්බද පරවශතාවයක් ඇත. ඒලියස්ගේ දේපළ ඔහුගේ උරුමකරු වූ ඩෙසිමස් ට උරුම කරමින් ඒලියස් මියගියේය. රොමියුලස් ඉඩම හරහා ගමන් කිරීමට උත්සාහ කළ විට, නව හිමිකරු වූ ඩෙසිමස්, රොමියුලස්ව නවතා ඔහුට ඉඩමට ඇතුළුවීමට ඉඩදීම ප්‍රතික්ෂේප කළේය. ඩෙසිමස් කියා සිටියේ එවැනි පරවශතාවයක් ගැන තමා නොදන්නා බවත් ඒලියස් රොමියුලස්ට ලබා දුන් අයිතියකින් තමා බැඳී නොමැති බවත්ය.

(ලකුණු 05)

(ආ) මාර්ටිනස් විසින් අක්කර දහයක මිදි වත්තක පිහිටි ඔහුගේ එක් නිවාඩු නිකේතනයක් ගිම්හානය සමය ගත කිරීම සඳහා මාස තුනක කාලයකට කැසියන් ට ලබා දෙන ලදී. කැසියන් ඔහුගේ පවුලේ අය සමඟ එම ස්ථානයේ පදිංචියට පැමිණි අතර, කැසියන් නැවතී සිටින කාලය තුළ එහි අස්වැන්න භුක්ති විඳීමට ද මාටිනස් ඔහුට අවසර දුන්නේය. කෙසේ වෙතත්, ඔවුන් එහි විසූ දෙවන මාසය තුළ, කැසියන්, නිවස අසල මිදි වත්තෙන් කොටසක් එළිපෙහෙළි කර, ඔහු විසින් කුලියට ගත් විනෝදාස්වාදය සපයන්නන් කණ්ඩායමකට නවාතැන් ගැනීම සඳහා තාවකාලික වාසස්ථානයක් ඉදි කළේය.

(ලකුණු 05)

(ලකුණු10+05+05=20)

7. පහත සඳහන් අවස්ථාවන්හි අදාළවන නීතිමය මූලධර්ම සහ අනුෂාංග පැහැදිලි කරන්න:

(i) ෆීලික්ස් තම දියණියගේ විවාහ උත්සවය සඳහා නීරෝගෙන් රන් කාසි 100 ක් සහ වයින් විශාල ප්‍රමාණයක් ණයට ගත් අතර, මාසයක් ඇතුළත මුදල් සහ වයින් යන දෙකම නීරෝට ආපසු ලබා දෙන බවට පොරොන්දු විය. ෆීලික්ස් තම පොරොන්දුව ඉටු කළ විට, ඔහුට දුන් ණය මුදලට පොලියක් ලෙස වැඩිපුර රන් කාසි 20 ක් නීරෝ විසින් ඉල්ලා සිටියේය.

(ii) ඇක්විලියස් තිරිඟු ගෝනි 30 ක් ඔහුගේ අසල්වැසි කැස්කාට ලබා දුන් අතර කැස්කාගේ අශ්ව කරත්තය ඇපයක් ලෙස තබා ගත්තේය. කෙසේ වෙතත්, ගංවතුරෙන් ඔහුගේ අස්වැන්න විනාශ වූ බැවින් එකඟ වූ කාල සීමාව තුළ තිරිඟු ආපසු ලබා දීමට කැස්කාට

නොහැකි විය. පසුව, කැස්කාට දැනගන්නට ලැබුණේ ඇක්විලියස් තිරිහු ගෝනි ලබා දුන් වහාම අශ්ව කරත්තය විකුණා ඇති බවයි.

(iii) ජූලියානෝ, සුප්‍රසිද්ධ රෝම චිත්‍ර ශිල්පියෙකු වන අරෙලියස්ගේ වටිනා සිතුවමක් කලා කෘති අලෙවි කරන්නෙකු ගෙන් මිලදී ගෙන රන් කාසි 200 ක් ගෙව්වේය. පසුව ඔහු සොයා දැන ගත්තේ අධිරාජයා විසින් අලුතින් පනවන ලද නීතියක් මගින් අරෙලියස් ඇතුළු චිත්‍ර ශිල්පීන් කිහිප දෙනෙකුගේ කලා කෘති විකිණීම තහනම් කර ඇති බවයි. ලැබිය හැකි දඬුවම් වළක්වා ගැනීම සඳහා සිතුවම ආපසු ලබා දී ඔහු ගෙවූ මුදල අයකර ගැනීමට ජූලියානෝ බලාපොරොත්තු වේ.

(iv) එම මුදල තමා ණය වී ඇති බවට විශ්වාස කරමින්, අවුලුස් විසින් රිදී කාසි 500 ක් ලීනස්ට ගෙව්වේය. කෙසේ වෙතත්, වසරකට පෙර එම ණය ගෙවා ඇති බව සනාථ කරන ලියවිල්ලක් අවුලුස් විසින් පසුව සොයා ගත්තේය. මුදල් ආපසු ලබා දෙන ලෙස අවුලුස් ඉල්ලා සිටි විට, තමා ණයගැති නොවන බව අවුලුස් දැන සිටි බවත්, ගෙවීම තෑග්ගක් ලෙස සැලකිය යුතු බවත් පවසමින් ලීනස් එය ප්‍රතික්ෂේප කළේය.

**(ලකුණු 05x4=20)**

8. රෝම කාර්ය පටිපාටික නීතියේ පරිණාමය සලකා බලමින් පහත ප්‍රකාශයන් පිළිබඳව අදහස් දක්වන්න.

(i) 'රෝම කාර්ය පටිපාටික නීතිය යනු රෝම අධිකරණවල භාවිතා කරන ලද දීර්ඝ කාලීනව පරිණාමය වූ පද්ධතියක් වන අතර, එය පසුකාලීන සිවිල් නීති රටවල නවීන කාර්ය පටිපාටිය සඳහා පදනම විය'.

(ii) 'රෝම නීතියේ ප්‍රයිටෝරියානු පිළියම් යනු *ius civile* හි දැඩි රීති වලට ඔබ්බෙන් ජ්‍යෙෂ්ඨ මහේස්ත්‍රාත්වරයෙකු වන ප්‍රයිටර් වරයා විසින් ලබා දෙන ලද නඩුකර සහ ආරක්ෂණයන් වේ '.

**(ලකුණු 10 x 2 =20)**

-හිමිකම් ඇවිරිණි-